# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# බීජ පනත යටතේ තේ පැළ තවාන්කරුවන් ලියාපදිංචි කිරීම

2003 අංක 22 දරන බීජ පනතේ 8 වැනි වගන්තියට අනුව, සියලුම බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිහරණය කරන්නන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ විෂයභාර අධ්‍යක්ෂවරයා වෙත ලියාපදිංචි විය යුතුය. එසේ ලියාපදිංචි නොවන බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිහරණය කරන්නන්ට බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම 2026 වර්ෂයේ සිට සපුරා තහනම් වේ.

එබැවින් අදාළ ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා පහත සඳහන් ආකෘතිය සම්පූර්ණ කර 2025 ඔක්තෝම්බර් 07 දිනට පෙර පහත සඳහන් කාර්යාලයක් වෙත භාර දීමට කටයුතු කළ යුතුය.

උක්ත පනතේ විධිවිධාන පරිදි, ඉදිරියේදී ප්‍රමිතියට අනුකූල බවට සහතික කරන ලද තේ පැළ (රෝපණ ද්‍රව්‍ය) පමණක් අලෙවි කිරීමට අවසර ලැබෙන අතර, ප්‍රමිතියට අනුකූල නොවන තේ පැළ අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

එසේ තේ පැළ සහතික කිරීම සඳහා සලකා බලනු ලබන්නේ, තොරතුරු ලබා දී රෝපණ ද්‍රව්‍ය පරිහරණය කරන්නන් ලෙස ලියාපදිංචි වන අයදුම්කරුවන් පමණක් වන බැවින් ඔබගේ තොරතුරු අදාළ අංශ වෙත නොපමාව ලබා දීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

**තොරතුරු ලබා දිය යුතු ආකෘතිය**

**2003 අංක 22 දරන බීජ පනත යටතේ තේ පැළ තවාන්කරුවන් ලියාපදිංචි කිරීම**

1. තවාන්කරුගේ නම :-
2. ලිපිනය :-
3. හැඳුනුම්පත් අංකය :-
4. දුරකථන අංක :-
5. විද්‍යුත් තැපැල් ලිපිනය (ඇත්නම්) :-
6. තවානේ නම :-
7. තවානේ පිහිටීම :-
   - දිස්ත්‍රික්කය :-
   - ලිපිනය :-
   - තවාන පවත්වාගෙන යනු ලබන භූමිය පිළිබඳ විස්තර (වපසරිය) :-
8. මව් අතු ලබා ගන්නා ක්‍රමය :-
9. නිපදවන තේ පැළවල ප්‍රභේද :-
10. වත්මන් පැළ ධාරිතාව :- (මාසික/වාර්ෂික)
11. තේ පැළ නිපදවන්නේ තම භාවිතයටද / විකිණීමටද යන බව :-
12. දැනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇත්නම් එම ලියාපදිංචි අංකය :-

මෙම ආකෘති පත්‍රය පහත සඳහන් වෙබ් අඩවි වලින් බාගත කරගත හැක.

https://plantation.gov.lk https://srilankateaboard.lk

සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර 071 4157611 අංකයට WhatsApp කිරීමට හෝ ratnaweerarop@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කිරීමටද අවස්ථාව ඇත.

**ලියාපදිංචිය සඳහා තොරතුරු එවිය යුත්තේ,**

➢ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, 11 වන මහල, සෙත්සිරිපාය 2 වන අදියර, බත්තරමුල්ල.

➢ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, "සෙන්ට් කුම්බස්" වතුයාය, තලවකැලේ.

➢ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල

1 ගාල්ල - වලහන්දුව වත්ත, වලහන්දුව 091-7201127
2 මාතර - නො.31, කාලිදාස පාර, මාතර- 041-7200799
3 නුවරඑළිය - නව නගරය, කොත්මලේ - 052-4930247
4 බදුල්ල - නව බදුල්ල පාර, බණ්ඩාරවෙල - 057-7200084
5 මහනුවර - නො.2/7/1, ගන්නෝරුව පාර, පේරාදෙණිය - 081-7200827
6 කළුතර - දඩුගොඩයා වත්ත පාර, ඉද්දගොඩ, මතුගම - 034-2211690
7 රත්නපුර - නො. 1/28, නව නගරය, රත්නපුර - 045-7201904 /045- 7201315
8 කෑගල්ල - කෘෂිකර්ම ගොඩනැගිල්ල, කච්චේරිය පාර, කෑගල්ල - 035-7201045

➢ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල

1 කළුතර - වතුරාණ පාර, බදුරලිය - 034-2247444
2 බදුල්ල - විසාකා මාවත, බණ්ඩාරවෙල - 057-2222812
3 ගාල්ල - නො. 59/A, වලහන්දුව වත්ත, වලහන්දුව - 091-2232052
4 මාතර - නො. 23, අළුත් මාවත, උයන්වත්ත, මාතර - 041-2222636
5 රත්නපුර - නො. 61, නව නගරය, රත්නපුර - 045-2222136
6 මහනුවර - නො.140, අඹගමුව පාර, ගම්පොල - 081-2352279
7 නුවරඑළිය - නො.10, නානුඔය පාර, කැලේගාල, නුවරඑළිය - 052-2234658

වැඩිදුර තොරතුරු සඳහා විමසීම්:- අධ්‍යක්ෂ ජනරාල් (කෘෂි) 011-2177767, 070-6157611

**ලේකම් - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, සෙත්සිරිපාය 2 වන අදියර, බත්තරමුල්ල 2025/09 /24**